# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/75 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ, ම විසින් 2022 ජුලි මස 22 දිනැති අංක 2289/43 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය වරින්වර සංශෝධනය කරන ලදුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් 2023 දෙසැම්බර් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2023 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 03. තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 6. අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

7. ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය

(2) එම නිවේදනයෙහි "අංක 14. කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 36. අයිතමයට පසුව පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

37. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

1A - G 41102 — 361 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) එම නිවේදනයෙහි "අංක 22. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි:-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමය ඉවත් කිරීමෙන්;

- එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම පනත (1981 අංක 48)

EOG 12 - 0352

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.